(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 18.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 පෙබරවාරි 07 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරනු ලබන ස්ථිර, කොන්ත්‍රාත් සහ අනියම් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා වැටුප්, දීමනා සහ ප්‍රසාද දීමනා වශයෙන් එම සේවකයන්ට ගෙවන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදුලි රැහැන් ඇදීම, වලවල් කැපීම සහ විදුලි විසන්ධි කිරීම් ආදී කාර්යයන් කොන්ත්‍රාත් ආයතනවලට ලබා දී තිබෙන බව පිළිගන්නේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවලට ගෙවා ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරික්ත සේවකයන් විශාල පිරිසක් සිටියදී සහ ඔවුන්ට ඉහළ වැටුප්, දීමනා සහ ප්‍රසාද දීමනා ගෙවන තත්ත්වයක් තුළ ඉහත (iii) හි සඳහන් කාර්යයන් කොන්ත්‍රාත් ආයතනවලට ලබා දීමට හේතු වූ කරුණු කවරේද;

(vi) එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

63/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ලෝකයේ බොහෝ රටවල ආර්ථික කටයුතු ඇතුළු විවිධ කටයුතු සඳහා මේ වනවිට ඩිජිටල් තාක්ෂණය භාවිතා කරන බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ රජයේ ආයතන තුළ සිදුවන විවිධ දූෂණ හා වංචා වළක්වා ගැනීම සඳහා එම ආයතන තුළ ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

73/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතීවුපට්රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කාක්කාච්චිවට්ටෙයි, විලාන්තෝට්ටම්, දික්කෝඩෙයි-දුම්බාලෙයි සහ මන්මුනෙප්පට්රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරාන්කුලම්-ධර්මපුරම් යන ප්‍රදේශ සඳහා පානීය ජල පහසුකම් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් ප්‍රදේශ සඳහා පානීය ජල පහසුකම් සැපයීමට ගනු ලබන පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

83/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් රක්ෂණ ක්‍රමය මඟින් ආවරණය කරනු ලබන භෝග වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මණ්ඩලය විසින් වගා හානි වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මණ්ඩලයට අරමුදල් ලැබෙන ක්‍රමවේදය කවරේද;

(iii) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

123/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව පවත්වනු ලබන විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා වාර්ෂිකව බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධිධාරීන් වැඩි වශයෙන් ගුරු සේවයට බඳවා ගැනීමට එම උපාධි පාඨමාලාව හේතුවන බව දන්නේද;

(v) එසේ නම්, එම පාඨමාලාව හැදෑරීම සඳහා බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6\.

151/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල පද්ධතියට එකතු කර ඇති සූර්ය විදුලිබල ධාරිතාවය කොපමණද;

(ii) සූර්ය විදුලි බලය මඟින් ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල පද්ධතියට වාර්ෂිකව එකතු කරනු ලබන විදුලි බලශක්තිය කොපමණද;

(iii) "සූර්ය බල සංග්‍රාමය" ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(iv) "සූර්ය බල සංග්‍රාමය" මඟින් හඳුන්වා දෙන ලද Net +, Net Metering සහ Net Accounting යන ක්‍රමවේදයන් යටතේ ජාතික විදුලිබල පද්ධතියට එකතු කර ඇති සූර්ය විදුලිබල ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සූර්ය විදුලිබලය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7\.

178/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ඉතිරි කිරීමේ බැංකුව සංස්ථාගත කළ දිනය;

(ii) වත්මන් සභාපතිවරයාගේ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ නම්;

(iii) ශාඛා සහ සේවක සංඛ්‍යාව;

(iv) අද වන විට කොටස් නිකුතු ප්‍රාග්ධනය;

(v) එය ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ බාසල් (BASEL) නියමයට අනුකූල වන්නේද;

(vi) අනුකූල නොවන්නේ නම්, ඒවා විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර 10 සඳහා ලාභය සහ ඉදිරි වසර 3 සඳහා අපේක්ෂිත ලාභය;

(ii) ඉහත (i) අනුව පසුගිය වසර 10 සඳහා ආයෝජනය මත ප්‍රතිලාභ;

(iii) පසුගිය වසර 5 සඳහා පරිපාලන පිරිවැය සහ ආන්තික ණය අනුපාතිකය;

(iv) පරිපාලන පිරිවැය ණය අනුපාතිකයේ ප්‍රතිශතයක් ලෙස;

(v) 2019 සිට මේ දක්වා ශේෂ පත්‍ර අගයන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රුපියල් බිලියනයකට වඩා වැඩි ණය මුදල් කපා හැරියේද;

(ii) ඊට අදාළ ආයතනවල නම්;

(iii) ණය කපා හැරීම් සඳහා අනුගමනය කර ඇති නෛතික කාර්යපටිපාටි කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

246/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාස අතරින් උතුරු කොළඹ අධ්‍යාපන කොට්ඨාසය තුළ ජාතික පාසලක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඉදිරියේදී උතුරු කොළඹ අධ්‍යාපන කොට්ඨාසය තුළ ජාතික පාසලක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා සුදුසු පාසලක් තෝරා ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා සුදුසු පාසලක් ඉදිරියේදී තෝරා ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

256/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෙන්තර, කයිකාවල පිහිටුවා ඇති ජනකලා කේන්ද්‍රය මේ වනවිට භාවිතයට නොගෙන අතහැර දමා ඇති බව දන්නේද;

(ii) එම ජනකලා කේන්ද්‍රය තවදුරටත් භාවිතා කළ හැකි මට්ටමක පවතින්නේද;

(iii) නොඑසේ නම්, එය ප්‍රතිසංස්කරණය කිරීම මඟින් නැවත භාවිතයට ගත හැකිද;

(iv) එහි පරිපාලන කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

290/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත, "කොවිඩ්-19" වසංගත රෝගය වැළදීම හේතුවෙන් මියගිය පුද්ගලයන්ගේ මළ සිරුරු මඩකලපුව "මජ්මා නගර්" ප්‍රදේශයේ භූමදානය කරන ලද අතර ඒ සඳහා ත්‍රිවිධ හමුදාවේ සහාය හා දායකත්වය ලබා ගත් බව දන්නේද;

(ii) එම භූමදාන කටයුතු සඳහා අනුයුක්ත වී සිටි එක් එක් අනු කණ්ඩයේ මාණ්ඩලික නිලධාරින් සහ සෙසු නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මූලික වැටුපට අමතරව එම නිලධාරින්ට ගෙවන ලද දීමනා කොපමණද;

(iv) එම භූමදාන කටයුතු සඳහා භාවිතා කරන ලද ත්‍රිවිධ හමුදාවේ වාහන සහ කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉන්ධන සඳහා එම එක් එක් වාහනය වෙනුවෙන් දරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම භූමදාන කටයුතු සඳහා මියගිය පුද්ගලයන්ගේ ඥාතීන්ගෙන් මුදල් අය කරනු ලැබුවේද;

(vii) එසේ නම්, එසේ අයකරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 17 සඳුදා පූ.භා. 9.45 වනතෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා. 1/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂ ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිත කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා. 11/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— සමුපකාර සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියට නිසි ප්‍රසම්පාදන වැඩසටහනක් සකස් කිරීම,— ග්‍රාමීය ජනතාවට ඉතාම සමීප ව්‍යාපාරයක් වූ සමුපකාර ව්‍යාපාරය මේ වනවිට විවිධ ගැටලුවලට මුහුණ දී තිබෙන හෙයින් සමුපකාර සමිති සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියට රජය විසින් නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා. 13/2024

ගරු රෝහණ බංඩාර මහතා,— රජය සතුව සහල් සංචිතයක් පවත්වාගෙන යාම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළ පෞද්ගලික ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුගේ ග්‍රහණයට නතුව තිබෙන හෙයින් වෙළඳපොළ තුළ සහල් මිල පාලනය කිරීම සඳහා රජය සතුව සහල් සංචිතයක් පවත්වාගෙන යාමට රජය විසින් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා. 15/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු සුබසාධන නිලධාරින් පත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුවිශාල දායකත්වයක් ලබා දෙන විදේශගත ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු සම්බන්ධව වගකීම් දරන කම්කරු සුබසාධන නිලධාරින් පත් කිරීමේ දී මෙතෙක් නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම හේතුවෙන් ගැටලු රාශියක් මතු වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා. 24/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අහෝසි කිරීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම නිල කාලය අවසන් වූ පසුව විශ්‍රාම වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින් විරුද්ධත්වයක් දක්වන බව ඉතා පැහැදිලිව පෙනෙන හෙයින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා. 28/2024

ගරු  නීතිඥ රවුෆ් හකීම් මහතා,— කොවිඩ්-19 වසංගතයෙන් මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු මිහිදන් කිරීමෙන් වැළකී ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු භූමදානය කිරීමේ හැකියාව පවතින බවට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් උපදෙස් නිකුත් කරනු ලැබ තිබියදී එම මළ සිරුරු භූමදානය කිරීමෙන් භූගත ජලයට වෛරසය මුසු වීමේ අවදානමක් පවතින බවට 2020 දී ආණ්ඩුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මත පදනම්ව එම මළ සිරුරු ඥාතීන්ගේ එකඟතාවයකින් තොරව ආදාහනය කළ හෙයින් ද, පසුව, එසේ ගනු ලැබූ තීරණය මත ක්‍රියාත්මකවීම නිවැරදි නොවූ බව සඳහන් කරමින් රජය විසින් නිල වශයෙන් සමාව අයැදීම සිදු කළ හෙයින් ද, මෙම වසංගතයෙන් මිය ගිය තැනැත්තන්ගේ ඥාතීන්ට සිය ආගමානුකූලව අවසන් කටයුතු සිදු කිරීමට හෝ එම සිරුරු දැක බලා ගැනීමට හෝ අවස්ථාව අහිමි වූ හෙයින් ද, මේ සම්බන්ධයෙන් දේශීය හා අන්තර්ජාතික මට්ටමින් ගොඩනැගුණු විරෝධතා සහ බලපෑම් හේතුවෙන් ආදාහනය කිරීම වෙනුවට මඩකලපුවේ ඔඩ්ඩමාවඩි, මජ්මා නගර් නම් හුදෙකලා ප්‍රදේශයේ එම සිරුරු භූමදානය කළ හෙයින් මිය ගිය තැනැත්තන් වෙනුවෙන් ඉටු කළ යුතුව තිබූ ආගමානුකූල චාරිත්‍ර සහ අවසන් ගෞරව දැක්වීමේ අයිතිය ඥාතීන්ට අහිමි වූ හෙයින් ද, මිය ගිය තැනැත්තන්ගේ පවුලේ සාමාජිකයන් හා සමීපතම ඥාතීන්ට සාධාරණය ඉෂ්ට කිරීමේ අවශ්‍යතාවය සහ මහජන ඉල්ලීම් සැලකිල්ලට ගෙන රජයේ පාර්ශ්වයෙන් සිදු වූ ඉහත සඳහන් බරපතල වැරදි විමර්ශනය කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා. 2/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල  තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ චර්යාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ චර්යාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද සුදුසු පරිදි කප්පාදු කිරීම,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද පිළිබඳව මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන් හි මෙන්ම මෙරට ජන සමාජය තුළ කතිකාවක් ඇති වී තිබෙන හෙයින්, රටේ පොදු ජනතාවගේ ඉල්ලීමට සවන්දෙමින් ඔවුන්ගේ අපේක්ෂාවන් සඵල කිරීම පිණිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට, හිටපු රාජ්‍ය නායකයන්ට හා එම වැන්දඹුවන්ට විරාත් කාලයක් ලබා දී තිබූ වරප්‍රසාද සුදුසු පරිදි අඩු කිරීම, ඉවත් කිරීම හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරයන්ගෙන් සාධාරණ පිළිතුරක් පාර්ලිමේන්තු සභාව තුළ දී සාකච්ඡා කොට ලබා ගැනීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා. 12/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා වෙනත් ද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය පුද්ගලයන් කිහිපදෙනෙකු අත රඳා පැවතීම නිසා ජනතාවට විවිධ අසීරුතාවයන්ට මුහුණදීමට සිදුවී තිබෙන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා. 14/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය නිසි අධීක්ෂණයකට ලක් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට ඉතාම සමීප සමුපකාර ග්‍රාමීය බැංකු රැසක් පසුගිය කාලයේ දී විවිධ හේතු මත බිඳ වැටීමෙන් එහි තැන්පත්කරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා එම බැංකු රජය විසින් නිසි අධීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරහ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා. 19/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— විගණන වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සිදුවන විවිධ මූල්‍යමය වංචා පිළිබඳව විගණන වාර්තා මඟින් කරුණු හෙළි කරන හෙයින්, එවැනි වංචා හා දූෂණ රාජ්‍ය ආයතනවල සිදුවීම වැළැක්වීම සඳහා එම වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා. 23/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම,— ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා. 25/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත්වීමට නිවසක් ලබා දීම,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත් වීමට නිවසක් හිමි විය යුතු වන බැවින්, සෑම ගෘහමූලිකයෙකු හටම තම ආරක්ෂාව සහ යහ පැවැත්ම උදෙසා නිවසක් මිලදී ගැනීම, ඉදිකිරීම හෝ කුලියට ගැනීම සඳහා සවිබල ගන්වමින් ඔහු හෝ ඇය හට පහසුකම් සැලැස්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා. 27/2024

ගරු රවී කරුණානායක මහතා,— සෑම තරුණයෙකුම ඵලදායි රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත් කිරීම,— වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම තරුණයෙකුටම ඵලදායි රැකියාවක නියැලීමේ අයිතිය තිබිය යුතු අතර, රැකියාවක නිරත නොවන්නේ නම්, ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා මූල්‍ය ආධාර ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*29.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***